ලිංගික අපරාධයක් සම්බන්ධ පුවත් ඉදිරිපත් කිරීමේදී, එම අපරාධයන් සම්බන්ධයෙන් සැහැල්ලු නොකරමින්, නිසි වගකීමෙන් යුතුව වාර්තා කිරීම අවශ්‍ය නොවේ දැයි Ethics Eye අපි මීන් පෙර ද අසා ඇත්තෙමු.

එසේම, ලිංගික අපරාධයන් සැහැල්ලු කොට දැක්වීම ඔස්සේ, එවැනි අපරාධයන් සුළු කරුණු බවට ආකල්පයක් නිර්මාණය වීමටත්, ඒ ඔස්සේ එවැනි අපරාධ සමාජය තුළ සාමාන්‍යකරණය වීමටත් ඉඩක් නොමැතිදැයි ද අපේ ඇසිය යුතු වේ.

එම පසුතලය යටතේ ඇතැම් විට, කාලයක් පුරාවට සමාජය තුළ භාවිත වන භාෂාව පවා කෙතරම් දුරට යෝග්‍ය දැයි අපට ඇසීමට සිදු වේ.

පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් 11 වන ශ්‍රේණියේ සිසුවියකට ලිංගික අතවර කළ බවට පැවසෙන පුවතක් දිනමිණ පුවත් වාර්තාවකින් ඉදිරිපත් වී ඇති ආකාරය විමසා බලමු.

සිරස්තලය: "නියෝජ්‍යය විදුහල්පති සන්නිවේදන කාමරයේදී දැරියකගේ හිරිඔතප් බිඳලා"
උප සිරස්තලය: "අනේ මෙහෙම ආශාවක්"
(එය ලිංගික අතවරයක් බව අන්තර්ගතයේ දැක්වේ.)

"හිරිඔතප්" යනු පව් කිරීමට ඇති බිය හා ලජ්ජාව; ලජ්ජා සහ භය දෙක; විළි බිය යනුවෙන් සරසවි සිංහල ශබ්දකෝෂයේ දැක්වේ.

ඒ අනුව බලන විට,

1) මෙම සිරස්තලයෙන්, පාසල් දැරියට ලිංගික අතවරයක් සිදුවී ඇති බව, එහි නිසි බරපතළ භාවය සහිතව පාඨකයා වෙත සන්නිවේදනය වෙතැයි ඔබ සිතන්නේද?

2) ලිංගික අතවරයක් වාර්තා කිරීමට මෙම පුවත සඳහා යොදාගෙන ඇති සිරස්තලය සහ උප සිරස්තලය කෙතරම් දුරට ගැලපෙන්නේද ?